# නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ව්‍යාප්තිය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ අතර සබඳතාවය

**එච්.ඇම්. සේනානායක**

B.ED. (University of Colombo)
M.Ed. (University of Colombo)
P.G.D.E.M. (National Institute of Education)

UCLIB
493067

කොළඹ විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයකි

University of Colombo
Library
Sri Lanka

# සංක්ෂේපය

රටක සමාජ ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයේදී පාසල් අධ්‍යාපනයට සුවිශේෂ වැදගත්කමක් හිමිවේ. ශ්‍රී ලංකාවේ පාසල් මෙරට ජනතාවට දැනුම, කුසලතා හා ආකල්ප ලබා දීම හා වර්ධනය කිරීම පිළිබඳ විශාල වගකීමක් දරණු ආයතන ලෙස සඳහන් කල හැකි අතර සමාජ ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයට සෘජු සබඳතාවයක් දක්වන ආයතන ලෙස සඳහන් කළ හැකිය.

මෙරට පාසල් අධ්‍යාපනය පිළිබඳ වැදගත් ස්ථානයක් ලෙස නිදහස් අධ්‍යාපනය ආරම්භ වූ වර්ෂය ගැන සඳහන් කල හැකිය. ඒ තත්වය ඇති වූයේ මෙරට යටත් විජිත යුගයේදිය. එහෙත් 1948 දී ශ්‍රී ලංකාව යටත් විජිත භාවයෙන් මිදී නිදහස් රටක් බවට පත්වීම 1945 දී ආරම්භ වූ නිදහස් අධ්‍යාපනය වඩාත් අර්ථවත් කර ගැනීමට ලැබුනු අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. 1948 දේශපාලන පරිවර්තනය සිදු වී දැනට අඩසිය වසක් ගෙවී ඇත. එසේ වුවද මෙරට පාසල් අධ්‍යාපනය පිළිබඳව පවත්නා විවේචන හා පාසල් අධ්‍යාපනයේ අසතුටුදායක තත්වයන් දිනෙන් දින වඩ වඩාත් කරන අතට හැරෙමින් පවති. පාසල් අධ්‍යාපනයේ ඵලදායිතාවය පහල යාම පාසල් අධ්‍යාපනයට ඇතුළු වන පිරිස අඩු වීම අධ්‍යාපනයේ අතරමඟ විපතිතවන පිරිස අධික වීම අධ්‍යාපන නාස්තිය හා විවිධාකාර වූ අධ්‍යාපන විෂමතාවයන් ඒ විවේචන අතර කැපී පෙනෙන ඒවා වේ.

මෙම විවේචන වලින් ඉස්මතු කර ඇති පාසල් අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ සහ එයට සාධක වී ඇති කරුණු පිළිබඳව ගෙවී ගිය කාලය තුල අධ්‍යාපනය පිළිබඳ විද්වතුන්ගේ අවධානය යොමු වී ඇත. ඔවුන් මේ පිළිබඳව දක්වන අදහස්වල හරය වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිපාලනයේ පවත්නා දුර්වලතා මෙම තත්වයට හේතු වී ඇති බවයි. නිදහස ලැබීමෙන් පසුව පාසල් අධ්‍යාපනය ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත වූවත් ඊට යෝග්‍ය අධ්‍යාපන පරිපාලන ක්‍රමයක් ගොඩ නැගී නැති බව ඉන් ගම්‍ය වන අදහස වේ. 1960 දශකය ආරම්භ වනවිට ශ්‍රී ලංකාවේ පාසල් සංඛ්‍යාව 1948 වර්ෂයේ දී තිබූ පාසල් සංඛ්‍යාවට සාපේක්ෂව කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළත් අද දක්වාම අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ හා පාසල් පද්ධතිය අතර මනා සබඳතාවයක් දක්නට නැත. පාසල්

අධ්‍යාපනයට අදාල නීතියෙහි පවත්නා දුර්ලතාවයන් සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන කළමනුරණ අංශන්ට අදාල දුර්වලතාවයන් හැටියට මෙම නොගැලපීම වටහා ගැනීමට පුළුවන.

වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය විශාල අර්බුදයකට මුහුණ දී ඇත. අධ්‍යාපන ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම සහ එය ජනතාවගේ උරුමයක් බවට පත්කර සර්ව සාධාරණ පාසල් අධ්‍යාපන ක්‍රමයක් පවත්වාගෙන යාම මීට ඇති නිවරැදි විසඳුමය.එය නිර්මාණය කළ හැක්කේ මෙරට අධ්‍යාපන පරිපාලනයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායකවන ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යන පාර්ශව තුනටය. නිදහස ලැබීමෙන් පසුව ගෙවී ගිය අවුරුදු 50 තුළ මෙරට අධ්‍යාපන පරිපාලනයේ ප්‍රබල වෙනසක් සිදු වී නැත.එබැවින් ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කර රටේ පොදු හා පෞද්ගලික යහපත ඇති කිරීමට අධ්‍යාපන පරිපාලනයේ කිසියම් ගුණාත්මක වෙනසක් අවශ්‍ය වී ඇත.

මෙම පරිපාලන වෙනස්කම් කළ හැක්කේ පාසල් අධ්‍යාපනයට බලපාන විවිධ සාධක මනාව අධ්‍යයනය කිරීමෙනි. එමගින් සමාජ සංකීර්ණතාවයට යෝග්‍ය අධ්‍යාපන පරිපාලන ක්‍රමයක් සකසා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එමෙන්ම මානව හිතවාදී වූත් ප්‍රජාතන්ත්‍රවාදී වූත් පාසල් අධ්‍යාපනයක් පවත්වා ගෙන යාමට නම් අධ්‍යාපන පරිපාලකයින් තම හස්තය මගින් හසුරුවාලිය හැකි සියලු බලවේග හසුරුවාලීමද අවශ්‍ය වනු ඇත. ඒ හා සමානවම වැදගත් කාරණයක් වන්නේ අධ්‍යාපන පරිපාලන තීරණ ක්‍රියාවට නැංවීමට දායක වන කළමනාකරණ තලයේ සිටින පිරිස් සමග අධ්‍යාපන පරිපාලකයින් දක්වන සබඳතාවය සාර්ථක අධ්‍යාපන පරිපාලන ක්‍රමයකට හේතුවන බවය.